A

# නිවේදනය

"ජාතික ඖෂධ නියාමන අධිකාරිය" යන නමින් යුත් පනත් කෙටුම්පත පිළිබඳව නිවේදනයක් කරනු කැමැත්තෙමි.

ජාතියේ හිත පිණිස වහා අවශ්‍ය යැයි අමාත්‍ය මණ්ඩලය විසින් සහතික කරනු ලැබූ මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 (1) (ආ) ව්‍යවස්ථාව ප්‍රකාර අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කරනු ලැබීය.

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ සඳහන් සංශෝධන පනත් කෙටුම්පතට එකතු කිරීමට යටත්ව එම පනත් කෙටුම්පතේ විධිවිධාන කිසිවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට 123 ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි.